සැ. යු. - 2012.09.07 වැනි දින පළවූ අංක 1,775 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,776 - 2012 සැප්තැම්බර් 14 වැනි සිකුරාදා - 2012.09.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1450 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1455 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.*- (i) ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අගෝස්තු මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සිරිලක ප්‍රජා ශාන්ති පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අගෝස්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ඔක්තෝබර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 සැප්තැම්බර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවින්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජූනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## මුලටියන ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

මුලටියන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුරු සංඛ්‍යාව, වැටුප් පරිමාණ හා අධ්‍යාපන සුදුසුකම් :- උපලේඛනයේ සඳහන් කර ඇත.*

**උපලේඛනය**

| *අනු අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | 01 | රු. 11,730-10x120 - 10x130 - 10 x 145-12x160 - රු. 17,600 12 වන පියවර ආරම්භක පියවර වේ. | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව ඇතුලත්ව විෂයයන් 06ක් සමත් වී තිබීම. |
| 02 | මාර්ග කම්කරු | 04 | රු. 11,730-10x120-10x130- -10x145-12x160 -රු. 17,600 | 06 ශ්‍රේණිය සමත් විය යුතු ය. |
| 03 | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 11,730-10x120-10x130- -10x145-12x160 - රු. 17,600 | 05 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා තිබිය යුතු ය. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
(ii) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත අයවලුන් විය යුතු ය.
(iii) අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු කරනු ලැබූවකු හෝ මීට පෙර පළාත් පාලන ආයතන සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු ය.
(v) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
(දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත වන්නේ නම් උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මුලටියන ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසිවලට ද, කොන්දේසිවලට ද, දකුණු පළාත් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින් වර පනවනු ලබන කොන්දේසි වලට ද, පළාත් පාලන ආයතන වලට අදාළ අණපනත්/පනත්වලට අයත් විධිවිධානවලට ද මුලටියන සභාව මඟින් වරින්වර ගනු ලබන සභා සම්මුතිවලට ද, අනුකූලව සේවය කිරීමට එකඟ විය යුතුය.

04. බඳවා ගැනීමේ ක්‍රමය :-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර පහත සඳහන් සුදුසුකම්වලට ලකුණු ලබා දීම සිදු කෙරේ. :-

(i) පොදු කොන්දේසිවල සඳහන් හා වෙනත් අධ්‍යාපන සුදුසුකම්;
(ii) වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද (සාමදාන විනිශ්චයකරුවකු විසින් සහතික කළ යුතු ය);
(iii) පළාත් පාලන ආයතනයක සේවය කර තිබීම (සේවා සහතිකය ඉදිරිපත් කළ යුතු ය);

(iv) පෞරුෂත්වය හා සෞඛ්‍ය සම්පන්න බව;
(v) ක්‍රීඩා හෝ වෙනත් විශේෂ කුසලතා.

ඉහත එක් එක් ශීර්ෂය යටතේ ලකුණු 20ක් බැගින් උපරිම ලකුණු 100ක් හිමිවන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා හෝ ඔහුගේ නියෝජිතයකු ඇතුළත්ව සභාව විසින් නම් කරනු ලබන සිව් දෙනෙකුට වැඩි කණ්ඩායමක් වේ.

05. ඉල්ලුම් කළ යුතු ආකාරය :

(i) මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව තමන් විසින් සකස් කර ගත් අයදුම්පත්‍රයක් මඟින් ඉල්ලුම් කළ යුතු ය.
(ii) අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. :

(i) උප්පැන්න සහතිකය,
(ii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
(iii) අධ්‍යාපන සහතික,
(iv) වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්දට අදාළ සහතික,
(v) පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
(vi) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත යුතු ය.).

(iii) සියලුම අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2012.10.05 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, ප්‍රාදේශීය සභාව, මුලටියන" යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.

අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා සහතික පත්‍ර අසත්‍ය බව හෝ සාවද්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් සේවයේ යෙදී සිටින කවර අවස්ථාවක දී වුව ද ඔහු හෝ ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත්වනු ඇත.

ජයරත්න ගරුසිංහ,
ලේකම් (වැඩබලන),
මුලටියන ප්‍රාදේශීය සභාව.

2012 අගෝස්තු මස 28 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මුලටියන ප්‍රාදේශීය සභාවේ ………… තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :——————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————.
3. ස්ථිර ලිපිනය :——————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
5. උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
6. 2012………… දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
7. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
8. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමකින් ද යන වග ? :——————.
9. විවාහක/අවිවාහක බව :——————.
10. මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය :——————.
11. අධ්‍යාපන සුදුසුකම් :——————.

12. වෘත්තීය සුදුසුකම් :————————.

13. සේවා පළපුරුද්ද :————————.

14. වෙනත් විශේෂ කුසලතා :————————.

මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

*රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

ඉහත නම් සඳහන් ................................... මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ ................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුරට තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි ය/නොහැකි ය. ඔහු/ඇය කිසිදු විනයානුකූල දඬුවමකට මෙතෙක් ලක් වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————.

09-458

---

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

## තලවාකැලේ ලිඳුල නගර සභාව

තලවාකැලේ ලිඳුල නගර සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවාගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාත තුළ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු II ශ්‍රේණිය | 01 | PL3 2006A<br>රු. 12,470 - 10 x 130- 10 x 145 - 10 x 160- 12 x 170 - 18,860 | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු ය.<br><br>*පොදු සුදුසුකම් :*<br><br>1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි. මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.<br><br>2. තනතුර සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. පළාත් පාලන ආයතනයක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ. |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | 3. වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සහතික මගින් සනාථ කළ යුතුයි.)<br>4. අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් විය යුතුයි.<br>5. දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක් තිබිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුයි.<br>6. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. |
| 02 | මුරකරු III | 02 | PL1 2006A<br>රු. 11,730 - 18x 120-<br>රු. 13,890 (මාසික) | *අධ්‍යාපන සුදුසුකම් :*<br>දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි.<br>*පොදු සුදුසුකම් :*<br>1. ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.<br>2. අයදුම්පත භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් සභා රාජ්‍ය සේවයක නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.<br>3. තලවාකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.<br>4. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තකු විය යුතු ය. |

3.1 *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර/අනියම් තනතුරු දරන සේවකයින් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.
2. අයදුම්කරු/කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකිකයන් විය යුතු ය.
3. අයදුම්කරු/කාරිය තලවාකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03 ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.
4. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
6. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.
7. තලවාකැලේ ලිඳුල නගර සභා කාර්යාලයේ දැනට ආදේශක පදනම මත සේවය කරන සේවකයින්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
8. අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

3.2 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

1. මෙම තනතුර ස්ථිර ය; විශ්‍රාම වැටුප් සහිත ය.
2. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.
4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලට ද, මධ්‍යම පළාතේ පළාත් සභාවේ/මධ්‍යම පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා තලවාකැලේ ලිඳුල නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

4. ඉල්ලුම් කළ යුතු ආකාරය ඃ

1. මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි (12 x 8 ප්‍රමාණයේ) අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2012.09.28 වැනි දිනට පෙර ලේකම්, තලවාකැලේ ලිදුල නගර සභාව, තලවාකැලේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය). නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු වන අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

* උප්පැන්න සහතිකය,
* අධ්‍යාපන සහතිකය,
* තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය
* මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරියාගෙන් ලබාගත් එකක් විය යුතු ය.)
* වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේනම් එම සහතික (රජයේ/පළාත් පාලන).

3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

4. බඳවා ගැනීමේ ක්‍රමය :

* අයදුම්කරුවන් අතුරින් නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර පුරප්පාඩු පිරවීම සිදුකරනු ලැබේ.

* මෙම අයදුම්පත් කැඳ වූ පසු හෝ කැඳවන අතරතුර හෝ බඳවාගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ සියලු බලතල නගර සභාවේ ලේකම් සතු වේ.

එච්. එම්. පී. අජිත් පුෂ්පකුමාර,
ලේකම්,
තලවාකැලේ ලිදුල නගර සභාව.

2012 අගෝස්තු මස 20 වැනි දින,
තලවාකැලේ ලිදුල නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***තලවාකැලේ ලිදුල නගර සභාව***

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ........... තනතුර සඳහා අයදුම්පත්‍රය

1. (i) මුලකුරු සමග නම :——————.
   (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

2. ස්ථිර ලිපිනය :——————.
   2.1 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.

3. (i) උපන් දිනය :——————.
   (ii) 2012.09.28 දිනට වයස :——————.
   අවුරුදු :——————. මාස :——————. දින :——————.

4. ස්ත්‍රී පුරුෂ භාවය :——————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

6. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? :——————.

   පුරවැසිභාවය (පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචියෙන් ද යන්න සඳහන් කරන්න) :——————.

7. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :

   (i) සමත් වූ වසර/ශ්‍රේණිය :——————.

(ii) අ.පො.ස. (සා.පෙළ) විභාගය :——————.

විභාග අංකය :——————.

විභාග වර්ෂය හා මාසය :——————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස (සා.පෙළ)

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උ. පෙළ)

8. ඔබ දැනට නගර සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :——————.

9. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————.

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :——————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ........................................ මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකුල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————.
පදවි නාමය :——————.
දෙපාර්තමේන්තුව/ආයතනය :——————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය :——————.

09-414

# පළාත් පාලන නිවේදන

## වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික් වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයෙන් දක්වා ඇති මංමාවත් වලල්ලාවිට ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් 2012.03.30 දින අංක 1,752 *ගැසට් පත්‍රයේ* ප්‍රථම වරට පළ කරන ලදී.

එහි උපලේඛනයේ සඳහන් අංක 01 සිට 04 දක්වා ඇතුළත් මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්ති ප්‍රකාර මේ දක්වා කිසිම හිමිකම් හෝ විරෝධතාවයක් ඉදිරිපත් කර නැති බැවින් එම මංමාවත් වලල්ලාවිට ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රාදේශීය සභාව 24(3) වගන්ති ප්‍රකාර දෙවන වරට ප්‍රකාශයට පත් කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උදේනි අතුකෝරල,
සභාපති,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව,
මීගහතැන්න.

2012 අගෝස්තු මස 23 වැනි දින.

| *අනු අංකය* | *මාර්ගයේ නම* | *දිග කි. මී.* | *පළල මීටර්* | *ආරම්භය* | *අවසානය* |
|---|---|---|---|---|---|
| 01 | ගුලනවත්ත නාවල මණ්ඩගල පාර | 2.5 | 6.09 | නෙළුව පාර 06 කණුව | පැලවත්ත බදුරලිය පාර |
| 02 | වීරකන්ද පාර | 3.00 | 6.09 | නෙළුව පාර 05 කණුව | දාබඩ කන්ද |
| 03 | පොල්ගස් යාය පාර | 1.50 | 4.78 | වීරකන්ද පාරේ බී. පී. අබේරත්න මයාගේ නිවස | ඩබ්. ඒ. චන්ද්‍රසිරි මයාගේ නිවස |
| 04 | අක්කර 50 පාර | 3.50 | 4.78 | පහලහෙවෙස්ස රාජ්‍ය වතුයාය පාර | අක්කර 50 ගම්මානය. |

09-252

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.